# පුරප්පාඩු දැන්වීමයි
# මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීමට අදාළව අයදුම්පත් කැඳවීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීමට අදාළව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියට අයත් සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අභ්‍යන්තර වශයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **බඳවා ගැනීමට නියමිත තනතුරු**

| අනු අංකය | තනතුර | තනතුර අයත් සේවය හා ශ්‍රේණිය | සුදුසුකම් | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය I ශ්‍රේණිය | (සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨ 01 අනුව සිවිල්-07 කාණ්ඩය) | 01 |
| 02 | පළාත් අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) | | | 01 |

**02.** **වෙනත් සුදුසුකම්**

i. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයෙකු වීම.
ii. දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**02.** **බඳවා ගැනීමේ ක්‍රමය**

මෙම නිවේදනයේ දක්වා තිබෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ අදාළ අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, අනුමත ලකුණු නිර්ණායක යටතේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතා නිශ්චය කිරීමට අදාළව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත අදාළ පුරප්පාඩුව සඳහා තෝරා පත් කරනු ලැබේ.
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

**සටහන:** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03.** **අයදුම්පත් ඉදිරිපත් කිරීම**

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අදාළ අමාත්‍යාංශ ලේකම් සහ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව **" ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර"** යන ලිපිනයට **2026.03.16** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- එක් නිලධාරියෙකු තනතුරු දෙකට (02) ම අයදුම් කරන්නේ නම් තම අයදුම්පත්‍ර වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"........................ තනතුර සඳහා අයැදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.
- නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් , අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.

(ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

**04.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සළසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

මෙයට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2026 පෙබරවාරි මස 26 වැනි දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය